06 ජලජ ජීව සම්පත් කර්මාන්තයේ උන්නතිය සඳහා ආයතනවලින් ලැබෙන දායකත්වය

6.1 ජලජ ජීව සම්පත් කර්මාන්තය හා සම්බන්ධ ආයතනවල වගකීම හා කාර්යභාරය

ජලජ ජීව සම්පත් කර්මාන්තය විවිධ ප්‍රතිපත්ති, අණ පනත්, සංවර්ධනය, කළමනාකරණය, යටිතල පහසුකම්, සැපයුම්, අලෙවිකරණය, මූල්‍යමය ආධාර, පුහුණු ආදී විවිධ සේවාවල සාමූහික දායකත්වය තුළින් ක්‍රියාත්මක වේ. ජලජ ජීව සම්පත් කර්මාන්තයේ නියැලෙන්නන්ගේ සමාජයීය, ආර්ථික හා සංස්කෘතික සංවර්ධනයට උපකාරීවන, එම සම්පත්වල තිරසරභාවය පවත්වාගෙන යාම සඳහා අනුග්‍රහය සහ දායකත්වය සැපයීමට විවිධ ආයතන පිහිටුවා ඇත. එම ආයතන පහත සඳහන් පරිදි වර්ගීකරණය කළ හැකි ය.

- **රාජ්‍ය ආයතන** : අමාත්‍යාංශ හා ඒවා යටතේ පිහිටුවා ඇති දෙපාර්තමේන්තු, පළාත් සභා හා ප්‍රාදේශීය සභා, රාජ්‍ය ප්‍රතිපත්ති හා පරමාර්ථ සාක්ෂාත් කරගැනීමේ අරමුණෙන් ක්‍රියාත්මක වේ.

- **අර්ධ රාජ්‍ය ආයතන** : අමාත්‍යාංශ යටතේ ප්‍රතිස්ථාපනය කර ඇති සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල වේ. මෙම ආයතන ද රාජ්‍ය ප්‍රතිපත්ති හා පරමාර්ථ සාක්ෂාත් කරගැනීමේ අරමුණෙන් ක්‍රියාත්මක වේ.

- **පෞද්ගලික ආයතන** : ජලජ ජීව සම්පත් කර්මාන්තය මුළුමනින් ම පාහේ පෞද්ගලික ආයෝජන තුළින් වාණිජමය අරමුණෙන් ක්‍රියාත්මක වේ. මසුන් ඇල්ලීම මෙන් ම ඒ සඳහා යෙදෙන සියලුම සැපයුම්
  උදා: අයිස් නිෂ්පාදනය, යාත්‍රා හා ආම්පන්න නිෂ්පාදනය, මත්ස්‍ය නිෂ්පාදන අපනයනය

- **රාජ්‍ය නොවන සංවිධාන** : රජයේ කොටස්කරුවන් නොවන අතර මෙම සංවිධාන වාණිජමය අභිමතාර්ථ මත ව්‍යවසායක කටයුතුවල නොයෙදේ. මේවා ස්වේච්ඡා සංවිධාන වේ. සාමාජික මුදලින් හෝ වෙනත් බාහිර මූල්‍යමය ආධාර යටතේ මෙම සංවිධාන ක්‍රියාත්මක වේ. යම් අරමුණක් සඵල කර ගැනීම සඳහා එකම අදහසින් යුත් පිරිසකගේ එකතුවෙන් මෙම සංවිධාන බිහිවී ඇත. බොහෝ විට අරමුණු වන්නේ ජලජ ජීව සම්පත් සංරක්ෂණය, කළමනාකරණය, ප්‍රජාවගේ සමාජ ආර්ථික සංවර්ධනය, පුහුණුව හා දැනුවත් කිරීම් වැනි විෂය පථ වේ.

  රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය ප්‍රතිපත්ති හා අණපනත් ක්‍රියාත්මක කිරීමේ දී විශාල දායකත්වයක් සපයන අතර එම සංවිධාන පහත සඳහන් පරිදි වර්ගීකරණය කළ හැකි ය.

» ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන
» දේශීය මට්ටමින් ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන
» ජාත්‍යන්තර මට්ටමින් ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන

ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන

» ධීවර සමූපකාර සංවිධාන
» සවිය සංවර්ධන පදනම : මාදු ගඟ කළමනාකරණය
» මීගමුව, රුකව කලපු කළමනාකරණ අධිකාරිය

දේශීය මට්ටමින් ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන

» විසිතුරු මත්ස්‍ය අභිජනකයන්ගේ සංගමය
» සුළු ධීවර සම්මේලනය
» බහුදින යාත්‍රා හිමියන්ගේ සංගමය
» මුහුදු මත්ස්‍ය අපනයනකරුවන්ගේ සංගමය
» මාදැල් හිමියන්ගේ සංගමය
» ඉස්සන් වගාකරුවන්ගේ සංගමය
» සර්වෝදය

ජාත්‍යන්තර මට්ටමින් ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන

» ZOA ශ්‍රී ලංකාව
» Caritas ශ්‍රී ලංකාව
» සේවා ලංකා පදනම
» World Vision ආයතනය
» LEADS
» Solidarities
» IUCN

ක්‍රියාකාරකම

ජලජ ජීව සම්පත් කර්මාන්තයේ උන්නතිය සඳහා දායක වන පෞද්ගලික ආයතනවල ලැයිස්තුවක් සකස් කර එහි කාර්යභාරය පිළිබඳ තොරතුරු රැස් කරන්න

ඵලදායි ජලජ ජීව සම්පත් කර්මාන්ත සඳහා පුරෝගාමී ආයතනය වනුයේ ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයයි (MFAR). ජලජ සම්පත්වල තිරසාර උපයෝගීතාව සඳහා සැලසුම්, ප්‍රතිපත්ති සහ උපායමාර්ග සැකසීම සඳහා ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය සෘජුව ම දායකත්වය සපයයි.

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ (MFAR) කාර්යභාරය

» කරදිය, කිවුල්දිය හා මිරිදිය ධීවර කර්මාන්ත සංවර්ධනය, ප්‍රතිපත්ති සැකසීම, වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
» මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම
» ධීවර සමාජ සංවර්ධනය, සුරක්ෂිතභාවය සහ සුභසාධනය - ධීවර නිවාස යෝජනා ක්‍රම දියත් කිරීම, ධීවර ගම්මාන සඳහා යටිතල පහසුකම් සැපයීම/සහනාධාර ලබා දීම

ජලජ ජීව සම්පත් කර්මාන්තයේ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ එක් දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල පහක් ලෙස ආයතන හයක් ස්ථාපනය කර ඇත.

වගුව 6.1 - ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයට අයත් ආයතනවල කාර්යභාරය

ආයතනය	කාර්යභාරය
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව (DFAR)	» ධීවර හා ජලජ සම්පත් පනත නො. 02, 1996 හා එය යටතේ පැනවුණ රෙගුලාසි, නියෝග හා අණ පනත් කෙටුම්පත් කිරීම හා ක්‍රියාත්මක කිරීම » ධීවර කටයුතු තිරසාර කළමනාකරණය » අහිතකර ධීවර කටයුතු තහනම් කිරීම » ධීවර යාත්‍රා හා ධීවර මෙහෙයුම් සඳහා බලපත්‍ර ලබා දීම » ධීවර අපනයන සඳහා බලපත්‍ර නිර්දේශ කිරීම » ධීවර කර්මාන්තයේ දත්ත රැස් කිරීම, ගබඩා කිරීම, විශ්ලේෂණය හා ඒවා වාර්තාකරණය සහ යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම
ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (NARA)	» ජීව හා අජීව ජලජ සම්පත් (මිරිදිය, කිවුල්දිය හා කරදිය) සංවර්ධනය සඳහා සාගර හා සමුද්‍ර ජීව විද්‍යාව, මත්ස්‍ය නිෂ්පාදන සහ පසු අස්වනු තාක්ෂණය, යාත්‍රා හා ආම්පන්න, තොරතුරු තාක්ෂණය, පරිසර විද්‍යාව ආදී විවිධ ක්ෂේත්‍රවල පර්යේෂණ සිදු කිරීම හා අනුග්‍රහය දැක්වීම (පුහුණුවීම් හා අධීක්ෂණය) » සාගර සිතියම් හා මත්ස්‍ය සිතියම් නිර්මාණය කිරීම, මත්ස්‍ය භූමි පුරෝකථනය කිරීම » පරිසර ඇගයීම් වාර්තා ලබා දීම » පසු අස්වනු තාක්ෂණ ඇගයීම් වාර්තා සැපයීම
ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA)	» වෙරළබඩ හා කිවුල් දිය ජලජීවී වගා සංවර්ධනය » මිරිදිය ජලජීවී වගා හා ගොඩතර ධීවර කර්මාන්ත සංවර්ධනය » ජලජීවී වගා පුහුණු පාඨමාලා පැවැත්වීම » අභිජනන මධ්‍යස්ථානවලින් මත්ස්‍ය පැටවුන් බෙදා හැරීම » මත්ස්‍ය රෝග නිවාරණය සඳහා උපදෙස් ලබා දීම

ලංකා ධීවර සංස්ථාව (CFC)	» පාරිභෝගිකයා හා නිෂ්පාදකයා යන දෙපිරිසටමට ම වාසිදායක වන පරිදි මසුන් මිලදී ගැනීම හා වෙළඳාම » තොග, සිල්ලර හා ජංගම මත්ස්‍ය වෙළඳාම් මධ්‍යස්ථාන පවත්වා ගැනීම » ශීතාගාර පහසුකම් සැපයීම හා නඩත්තුව » මත්ස්‍ය අතුරු නිෂ්පාදන වෙළඳාම
ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව (CFHC)	» ධීවර වරාය, නැංගුරම්පොළ හා ඊට සම්බන්ධ පහසුකම් (තෙල්, ජලය, ගබඩා, අයිස් නිෂ්පාදනාගාර හා ශීතාගාර, වරාය හා නැංගුරම්පොළ) ඉදිකිරීම, කළමනාකරණය හා නඩත්තු කිරීම
සීමාසහිත සී-නෝර් පදනම (Cey-Nor)	» ධීවර යාත්‍රා හා ධීවර ආම්පන්න සැපයීම, ආනයනය හා නිෂ්පාදනය කිරීම

ජලජ ජීව සම්පත් කර්මාන්තයේ උන්නතිය සඳහා දායකත්වය සපයන වෙනත් අමාත්‍යාංශ හා ඒ යටතේ ක්‍රියාත්මක ආයතන පහත සඳහන් වේ.

වගුව 6.2 - ජලජ ජීව සම්පත් කර්මාන්තයේ උන්නතිය සඳහා ක්‍රියාත්මක වන ආයතන

අමාත්‍යාංශය	ආයතනය	කාර්යභාරය
යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය	ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය (NIFNE)	» කිමිදීම, ෆයිබර් තාක්ෂණය, පරිගණක තාක්ෂණය, ජල තාක්ෂණය, යාත්‍රා නියමු පුහුණු, ජීවිතාරක්ෂක, ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තය, ආරක්ෂාකාරී මුහුදු ගමන්, සමුද්‍ර ක්‍රියා වැනි අංශවල ඩිප්ලෝමා, වෘත්තීය පුහුණු හා සහතික පාඨමාලා පැවැත්වීම
	සාගර විශ්ව විද්‍යාලය (Ocean University)	» සාගර විද්‍යාව, සාගර ඉංජිනේරු විද්‍යාව, යාත්‍රා නිෂ්පාදනය හා නාවික වාස්තු විද්‍යාව පිළිබඳ උපාධි පාඨමාලා පවත්වාගෙන යාම

පරිසර අමාත්‍යාංශය	සමුද්‍ර පරිසර ආරක්ෂක අධිකාරිය (MEPA)	» සමුද්‍ර පරිසර දූෂණය වළක්වා ගැනීම, පාලනය කිරීම, අවම කිරීම හා කළමනාකරණය සඳහා කටයුතු කිරීම හා නීති ක්‍රියාත්මක කිරීම
	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව (DF)	» කඩොලාන වන විනාශය වැළැක්වීම, කළමනාකරණය හා ආරක්ෂා කිරීම
ගොවිජන සේවා හා වන සත්ත්ව අමාත්‍යාංශය	වන සත්ත්ව සංරක්ෂණ දෙපාර්තමේන්තුව (DWLC)	» කොරල්, කැස්බෑවන්, සියලුම මුහුදු ක්ෂීරපායීන් ඇතුලු තර්ජනයට ලක්ව ඇති ජලජ ජීවීන් සංරක්ෂණය තහවුරු කිරීම » සංරක්ෂිත ප්‍රදේශ, අභයභූමි හා ජාත්‍යන්තර වනෝද්‍යාන ඇති කිරීම
ආරක්ෂක අමාත්‍යාංශය	වෙරළාරක්ෂක හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව (CCD)	» වෙරළ කලාපයේ ස්වාභාවික මිනිස් ක්‍රියාකාරකමින් සිදු වූ හා විය හැකි විනාශය වැළැක්වීම » එම කලාපය තුළ සිදුවන සියලු ම ඉදිකිරීම් හා සංවර්ධන ක්‍රියා කළමනාකරණය » වෙරළ කලාපයේ සිදුවන සංවර්ධන කටයුතු සඳහා පාරිසරික ඇගයීම් වාර්තා ලබා ගැනීමට කටයුතු කිරීම » වෙරළ කලාපයේ සිදු කරන සංවර්ධන කටයුතු සඳහා අනුමැතිය ලබා දීම
ස්වදේශීය කටයුතු හා පළාත්බද අමාත්‍යාංශය	පළාත් සභා හා ප්‍රාදේශීය සභා	» පළාත් පාලන ආයතන තුළ ඇති ජලජ ජීව සම්පත් කර්මාන්ත පරිපාලනය

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය	රාජ්‍ය විශ්ව විද්‍යාල	» ධීවර හා ජලජ ජීව සම්පත් ක්ෂේත්‍රයේ පර්යේෂණ පැවැත්වීම » ධීවර හා ජලජ ජීව සම්පත් ක්ෂේත්‍රයේ උපාධි පාඨමාලා පැවැත්වීම

6.2 ජලජ ජීව සම්පත් කර්මාන්තයට අවශ්‍ය යටිතල පහසුකම්

ඵලදායී හා ආරක්ෂිත ජලජ ජීව සම්පත් කර්මාන්ත සංවර්ධනයේ දී යටිතල පහසුකම් සංවර්ධනය ප්‍රධාන අවශ්‍යතාවකි. මත්ස්‍ය සම්පත් අධික ව නෙළා ගන්නා කාලවල දී ශීතාගාර, ගබඩා හා වෙළඳපොළ වැනි යටිතල පහසුකම් නොමැති වීම නිසා මත්ස්‍ය සම්පත් විශාල වශයෙන් විනාශ වේ.

ජලජ ජීව සම්පත් කර්මාන්තයට අවශ්‍ය යටිතල පහසුකම් පහත සඳහන් වේ.

- » ධීවර වරාය
- » ප්‍රදීපාගාර
- » යාත්‍රාංගන
- » දැල් සැකසුම් මධ්‍යස්ථාන
- » ධීවර තොරතුරු අංශය
- » ගුවන් විදුලි සේවාව
- » අභිජනන මධ්‍යස්ථාන

ධීවර වරාය

ධීවර වරාය මත්ස්‍ය නිෂ්පාදනයේ පාදක ස්ථානය මෙන් ම මත්ස්‍ය වෙළඳාමේ ආරම්භක ස්ථානය ද වේ. බහුදින යාත්‍රා ආරක්ෂිත ව නවතා තැබීම හා ඒවායේ ක්‍රියාකාරකම් සිදු කරනු ලබන්නේ වරාය පාදක කර ගනිමිනි. ශ්‍රී ලංකාව තුළ මේ වනවිට ක්‍රියාත්මක ධීවර වරාය 20 කි.

ධීවර වරාය බහු කාර්ය යටිතල පහසුකම්වලින් යුක්ත වේ.

- » ආරක්ෂිත නාවික කටයුතු සඳහා ආලෝක සංඥා පද්ධති
- » දිය කඩනවලින් ආරක්ෂිත නැංගුරම් ප්‍රදේශයක්
- » පහසුවෙන් මසුන් ගොඩ බෑම සඳහා ජැටි



රූපය ඃ 6.1 - ශ්‍රී ලංකාවේ ධීවර වරාය පිහිටි ස්ථාන

» යාත්‍රා අළුත් වැඩියා කිරීමේ අංගන
» ඉන්ධන ගබඩා පහසුකම්
» මත්ස්‍ය සැකසුම් ශාලා
» ආම්පන්න නඩත්තු ශාලා
» විවේකාගාර
» අයිස් නිෂ්පාදනාගාර
» ශීතාගාර පහසුකම්
» වෙන්දේසි පොළ/ශාලා
» කාර්යාල
» ආපන ශාලා
» පිරිසිදු ජලය ලබා ගැනීම
» හොඳින් නඩත්තු කළ ප්‍රවේශ මාර්ග
» සන්නිවේදන පහසුකම්
» වාහන අංගන
» යාන්ත්‍රික වැඩපොළ
» මාළු පෙට්ටි ට්‍රක් රථවලට පහසුවෙන් ගබඩා කිරීමට හැකි වේදිකාවන්
» අපද්‍රව්‍ය හා කසළ කළමනාකරණ පද්ධතියක්/ වැඩ සටහනක්

ධීවර වරායක පහත සඳහන් අංග අඩංගු විය යුතු ය.
» නැංගුරම්පොළ හා තොටුපොළ
» වෙළඳ මධ්‍යස්ථාන
» ශීත ගබඩා හා අයිස් නිෂ්පාදනාගාර

නැංගුරම්පොළ හා තොටුපොළ

නැංගුරම්පොළ බොහෝ විට නිර්මාණය කර ඇත්තේ යාත්‍රා ගමන් කළ හැකි ස්වාභාවික ආරක්ෂිත ස්ථානවල ය(කලපු, මෝය). නැංගුරම්පොළ තුළ ඇති යටිතල පහසුකම් සීමාසහිත වන අතර ඒවා තුළ දියකඩවලින් ආරක්ෂිත නැංගුරම් ප්‍රදේශයක් නොමැති නිසා යාත්‍රා නවතා තැබීමක් සිදු නොකරයි. යාත්‍රාවෙන් මසුන් පහසුවෙන් ගොඩබෑමට හා යාත්‍රාවට අවශ්‍ය ද්‍රව්‍ය පැටවීමට පහසුවන පරිදි මෙය ජැටියකින් යුක්ත වේ. නැංගුරම්පොළ තුළ බොහෝ විට ජලය, අයිස්, ඉන්ධන ලබා ගැනීමේ පහසුකම්වලින් මෙන් ම ආම්පන්න නඩත්තු කිරීමේ ශාලා, වෙන්දේසි පොළ, හොඳින් නඩත්තු කළ ප්‍රවේශ මාර්ගවලින් ද යුක්ත වේ.

තොටුපොළ යනු ධීවරයන් තම යාත්‍රා නවතා තැබීමට යොදා ගන්නා මෝය, බොකු, කලපු, දිය අගල් හෝ ගංගා වැනි ආරක්ෂිත ස්ථාන වේ. තොටුපොළ බොහෝ විට ධීවර නිවාස ආසන්නයේ දක්නට ලැබේ. බොහෝ තොටුපොළවල යටිතල පහසුකම් දක්නට නොලැබේ. වැඩි ප්‍රමාණයක් යාත්‍රා නවතා ඇති තොටුපොළවල වෙන්දේසි පොළක් හා ආම්පන්න නඩත්තු ශාලා දක්නට ලැබේ. බොහෝ විට එම ස්ථානවල නවතා ඇති කුඩා යාත්‍රා වෙරළාසන්න ප්‍රදේශ, කලපු හෝ ජලාශ තුළ ධීවර කර්මාන්තයේ යෙදෙන යාන්ත්‍රික නොකළ යාත්‍රා වේ. ඒවා සඳහා ඉන්ධන අවශ්‍යතාවක් නොමැත. ධීවර කටයුතු සීමිත

කාලයක දී සිදුකරන බැවින් ජලය සහ අයිස් රැගෙන නොයයි. යාන්ත්‍රික යාත්‍රා සඳහා ඉන්ධන ධීවරයන් විසින් බාහිරින් රැගෙන එනු ලැබේ.

වෙළඳ මධ්‍යස්ථානය

මෙහි සිදු කරන ප්‍රධාන කාර්යය වන්නේ මත්ස්‍ය සම්පත අලෙවි කිරීම ය. ශ්‍රී ලංකාව තුළ මත්ස්‍ය වෙළඳාම විශාල ලෙස සිදුකරනු ලබන්නේ පෞද්ගලික අංශය මගිනි. ධීවර සංස්ථාව තරඟකාරී ලෙස පෞද්ගලික අංශය සමග මත්ස්‍ය වෙළඳාම් කටයුතුවල යෙදේ. මත්ස්‍ය වෙළඳ මධ්‍යස්ථාන ක්‍රියාකාරිත්වය අනුව ආකාර කිහිපයකි.

- » තොග වෙළඳ පොළ
- » සිල්ලර වෙළඳ පොළ
- » ජංගම වෙළඳ සේවා

රූපය 6.2 ඃ පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ පොළ

මත්ස්‍ය තොග වෙළඳ මධ්‍යස්ථාන ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇත්තේ සීමිත ස්ථාන කිහිපයක ය. ඉන් ප්‍රධානත ම තොග වෙළඳ මධ්‍යස්ථානය වන්නේ පෑලියගොඩ ඇති මධ්‍යම මත්ස්‍ය වෙළඳ පොළයි. මීට අමතර ව මහනුවර වෙළඳ සංකීර්ණය තුළ හා මීගමුව, පිටිපන, බේරුවල වරාය තුළ ද සංවිධානාත්මක මත්ස්‍ය තොග වෙළඳාම් සිදු වේ. මීට අමතර ව සියලුම ධීවර වරාය ආශ්‍රිතව ද, රත්නපුර, මාදම්පේ යන ස්ථානවල ද කුඩා ප්‍රමාණයේ තොග වෙළඳාම් සිදු වේ. සිල්ලර වෙළඳුන් මසුන් ලබා ගනු ලබන්නේ මෙම තොග වෙළඳ මධ්‍යස්ථාන මගිනි.

මත්ස්‍ය සිල්ලර වෙළඳසැල් වර්ග 3 ක් හඳුනාගෙන ඇත.

1. නගර ආශ්‍රිත හා මාර්ග ආශ්‍රිත ව සිල්ලර වෙළඳ සැල් (මාළු කඩ හා මාළු ලෑලි)
2. ධීවර සංස්ථාවට අයත් වෙළඳ සැල් (CEYFISH)
3. සුපිරි වෙළඳසැල් (Super market)

ජංගම වෙළඳසැල් සඳහා නිශ්චිත ස්ථානයක් නොමැත. බොහෝ විට ධීවර සංස්ථාව මගින් ක්‍රියාත්මක මත්ස්‍ය ලොරි, ත්‍රී වීලර්, යතුරු පැදි, පා පැදි මෙන් ම කත් කරුවන් විසින් ද ජංගම මත්ස්‍ය වෙළඳාම සිදු කරයි.

ශීත ගබඩා හා අයිස් නිෂ්පාදනාගාර

මෙහි සිදු කරන ප්‍රධාන කාර්යය වන්නේ නෙළා ගත් මත්ස්‍ය සම්පත් ආරක්ෂාකාරී ව ගබඩා කිරීමය.

වගුව 6.3 - ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති අයිස් නිෂ්පාදන කර්මාන්තශාලා

දිස්ත්‍රික්කය	අයිස් නිෂ්පාදන කර්මාන්තශාලා
කොළඹ	3
මීගමුව	12
කළුතර	5
ගාල්ල	4
මාතර	10
තංගල්ල	11
යාපනය	11
මන්නාරම	7
මුලතිව්	1
මඩකලපුව	4
කල්මුනේ	2
ත්‍රිකුණාමලය	4
කුරුණෑගල	1
පුත්තලම	6
හලාවත	7
අනුරාධපුරය	1
පොළොන්නරුව	1

මූලාශ්‍රයː සංඛ්‍යාලේඛන අංශය - ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය (2013)

නෙළාගත් මත්ස්‍ය අස්වනු ගුණාත්මකභාවයෙන් පවත්වා ගැනීමට අවශ්‍ය අයිස් නිෂ්පාදනය කිරීම හා ගබඩා පහසුකම් ඇති කිරීම ඉතා වැදගත් ය. ධීවර වරායන් අයිස් නිෂ්පාදනාගාර පහසුකම් හා බොහෝවිට ශීතාගාර පහසුකම්වලින්ද යුක්ත වේ. ධීවර වරාය නීතිගත සංස්ථාව, ධීවර සංස්ථාව හා පෞද්ගලික අංශය මගින් ධීවර වරාය තුළ මෙන් ම ප්‍රධාන ධීවර ප්‍රදේශ ආශ්‍රිත ස්ථානවල ශීතාගාර සහ අයිස් නිෂ්පාදන කර්මාන්තශාලා ඉදිකර ඇත. 2013 වන විට ශ්‍රී ලංකාව තුළ අයිස් නිෂ්පාදන කර්මාන්තශාලා 90 ක් පිහිටුවා ඇති අතර එහි ධාරිතාවේ එකතුව දිනකට මෙට්‍රික්ටොන් 2680 ක් පමණ විය.

ප්‍රදීපාගාර

ප්‍රදීපාගාර ලෙස නම් කරන්නේ වෙරළබඩ නාවිකයන්ට සහ ධීවරයන්ට ස්ථාන හෝ ඉදිරියේ ඇති ආපදා ප්‍රදේශ හෝ ගමන් මාර්ග හඳුන්වාදීමට ඉදිකර ඇති ආලෝකය විහිදවන ස්ථම්භ වේ. මේවායේ ඇති විදුලි පහනින් නිකුත් කරන ආලෝක ධාරාව

දර්පණයක් මතට වැටීමෙන් ආලෝක ප්‍රභවය විශාල දුරක් විහිදීමට සලස්වයි. මෙම දර්පණය කැරකීම නිසා විහිදවන පරාවර්තන ආලෝක කදම්බය නිශ්චිත කාල පරාසයක දී ඇති වේ. අතීතයේ දී මේ සඳහා විදුලි පහන් වෙනුවට දැල්වෙන පහන් යොදාගනු ලැබිණි. ප්‍රදීපාගාර මගින් නිකුත් කරන විදුලි සංඥා ධාරාව සහ සංඥා නිකුත් කරන කාලාන්තරය එක් එක් ප්‍රදීපාගාරයට විශේෂ වේ. රාත්‍රී කාලයේ දී යාත්‍රාචරණයේ යෙදෙන නැව්, වෙනත් යාත්‍රා සහ ධීවරයන්ට නිවැරදි මාර්ගය, අවදානම් කලාප හා ස්ථාන හඳුනා ගැනීමට මෙය උපකාර වේ.

ප්‍රදීපාගාරයක විදුලි පහන සාමාන්‍යයෙන් පස්වරු 6.30 සිට පෙරවරු 6.30 අතර කාලය තුළ ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකාවේ වෙරළ තීරය වටා ක්‍රියාකාරී ප්‍රදීපාගාර 14 ක් ඇත. මේවා බොහොමයක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් පාලන හා නඩත්තු කටයුතු කරන අතර කිහිපයක් පමණක් ශ්‍රී ලංකා නාවික හමුදාව මගින් පාලනය වේ.

නාවිකකරණයේ දී වැදගත් වන ශ්‍රී ලංකාවේ ඇති ජාත්‍යන්තර ප්‍රදීපාගාර

- බාබේරියන් (බේරුවල) - Barberyn
- දෙවුන්දර තුඩුව - Dondra Head
- කුඩා රාවණා (කිරින්ද) - Little Basses
- මහා රාවණා (කිරින්ද) - Great Basses

රූපය 6.3 ඃ මහා රාවණා ප්‍රදීපාගාරය (Great Basses)

මීට අමතර ව පහත සඳහන් ස්ථානවල ද ප්‍රදීපාගාර හමු වේ.

- මඩකලපුවේ මතුවරන්
- ත්‍රිකුණාමල බොක්කේ චැපල් හිල්
- කොළඹ කොටුව
- කොළඹ වරායේ උතුරු දියකඩන කෙළවර හා දකුණු දියකඩන කෙළවර
- ත්‍රිකුණාමලයේ ෆවුල් පොයින්ට් (Foul point)
- ගාලු කොටුව
- හම්බන්තොට
- කන්කසන්තුරේ
- කාරතිව් කෝවිලන් පොයින්ට් (Covilan point)
- තලෙයි මන්නාරම
- මන්නාරම - උෆරු මලෙයි
- ඔලුවිල්
- පේදුරුතුඩුව
- සංගමන් කන්ද
- ත්‍රිකුණාමලයේ roud island

වෙරළබඩ ධීවර කර්මාන්තයේ යෙදෙන සුළු ධීවරයන් සඳහා ස්ථාන/තොටුපොළ හඳුනා ගැනීමට වෙරළ තීරය වටා බීකන් පහන් ඉදිකර තිබේ. මේවා විදුලි පහනකින් යුත් පහන් කණු වේ. මෙයින් නිකුත් වන ආලෝකය වෙරළේ සිට සීමිත ප්‍රදේශයක් දක්වා පැතිර යයි.



රූපය 6.4 ៖ ශ්‍රී ලංකාවේ ප්‍රදීපාගාර පිහිටි ස්ථාන

යාත්‍රාංගන

රාජ්‍ය අංශය මගින් ක්‍රියාත්මක වන යාත්‍රාංගන සීනෝර් පදනම මගින් පාලනය වේ. මීට අමතර ව පෞද්ගලික අංශය මගින් යාත්‍රාංගන රාශියක් පිහිටුවා ඇත. මෙය නැගී එන ව්‍යාපාරයක් වන අතර මෙරට මෙන් ම විදේශීය රටවලට ද ධීවර යාත්‍රා සහ විවිධ යාත්‍රා වර්ග මේවා තුළ නිෂ්පාදනය කරනු ලැබේ.

දැල් සැකසුම් මධ්‍යස්ථාන

රාජ්‍ය ආයතන මගින් පවත්වාගෙන යන දැල් සැකසුම් මධ්‍යස්ථාන සීනෝර් පදනම මගින් පාලනය වේ. මීට අමතර ව පෞද්ගලික අංශය මගින් දැල් සැකසුම් මධ්‍යස්ථාන ක්‍රියාත්මක වේ. ආනයනය කරන ලද නූල් මගින් කඹ සහ දැල් මෙම ආයතන තුළ දී නිෂ්පාදනය වේ.

වගුව 6.4 - ශ්‍රී ලංකාවේ ධීවර වරාය ආශ්‍රිත යටිතල පහසුකම්

යටිතල පහසුකම්		2009	2011	2012	2013
අයිස් නිෂ්පාදන කර්මාන්තශාලා	සංඛ්‍යාව	76	84	58	90
අයිස් නිෂ්පාදන ධාරිතාව	මෙ.ටො./දිනකට	2082	2301	2395	2658
ශීතාගාර	සංඛ්‍යාව	28	36	37	38
ශීතාගාර ධාරිතාව	මෙ.ටො./දිනකට	1175	2157	2142	2225
බෝට්ටු නිෂ්පාදන යාත්‍රාංගන	සංඛ්‍යාව	29	52	48	47
ආම්පන්න නිෂ්පාදන කර්මාන්තශාලා	සංඛ්‍යාව	6	6	6	6

මූලාශ්‍රය ៖ සංඛ්‍යාලේඛන අංශය - ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය (2013)

ධීවර තොරතුරු අංශය

ධීවර තොරතුරු, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන අංශය මගින් ද, අමාත්‍යාංශය යටතේ ප්‍රතිස්ථාපනය කර ඇති අනුබද්ධ ආයතනවල තොරතුරු එම ආයතන මගින් මෙන් ම ආයතනවල ඇති වෙබ් අඩවි මගින් ද පහසුවෙන් ලබා ගැනීමට හැකි ය. නාරා ආයතනයේ ප්‍රතිස්ථාපනය කර ඇති සාගර නිරීක්ෂණ මධ්‍යස්ථානය මගින් වාර්තාගත තොරතුරු, කාලගුණය හා මත්ස්‍ය පැතිරීම පිළිබඳ ව පුරෝකථන තොරතුරු ලබා ගැනීමට හැකි වේ. එසේ ම ධීවර හා ජලජ සම්පත් නෙළීම, ව්‍යාප්තිය හා විභවය පිළිබඳ යාවත්කාලීන තොරතුරු ලබා ගැනීමට පිළිවන.

ගුවන් විදුලි සේවාව

"සයුර ගුවන් විදුලිය", මෙය ධීවර ප්‍රජාව සඳහා ම වෙන් වූ ගුවන් විදුලි සේවයකි. මෙමගින් දියඹ මුහුදේ ධීවර කටයුතුවල නියැලෙන ධීවරයන් හා ඔවුන්ගේ පවුල් අතර මෙන් ම ධීවරයන් ධීවරයන් අතර ද සම්බන්ධය ඇති කිරීමට දායක වේ.

මෙය රාත්‍රී 12 සිට උදෑසන 4 දක්වා ක්‍රියාත්මක වේ. මෙමගින් වෙළඳ පොළ, කාලගුණය, දැනුම, මත්ස්‍යයන් ගැවසෙන ප්‍රදේශ හඳුන්වාදීම වැනි දැනුවත් කිරීමේ වැඩසටහන් හා සංවාද මෙන් ම විනෝදාස්වාදය ලැබෙන වැඩසටහන්, හදිසි නිවේදන යනාදිය ප්‍රචාරය වේ.

අභිජනන මධ්‍යස්ථාන

අභිජනන මධ්‍යස්ථාන රාජ්‍ය සහ පෞද්ගලික අංශය මගින් පවත්වා ගෙන යනු ලැබේ.

ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) මගින් මිරිදිය ආහාරමය මසුන් අභිජනන හා පැටවුන් වර්ධනය කිරීමේ මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලැබේ.

උඩවලව, ඉගිනියාගල හා දඹුල්ල යන අභිජනන මධ්‍යස්ථාන මගින් ප්‍රධාන වශයෙන් කාපයන් ද, තිලාපියන් ද අභිජනනය කරනු ලැබේ.

නුවරඑළිය මධ්‍යස්ථාන මගින් ට්‍රවුට් හා කාපයන් අභිජනනය සිදු කරනු ලබන අතර පම්බල (තිල්ල වටන) හා කහඳ මෝදර යෝධ ඉස්සන් අභිජනන මධ්‍යස්ථාන, පොතුකුඩිරුප්පු (මඩකලපුව) ඉස්සන් අභිජනන මධ්‍යස්ථාන, රම්බඩගල්ල මිරිදිය විසිතුරු මසුන් හා ශාක අභිජනන මධ්‍යස්ථාන ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය ආයතනය මගින් පවත්වාගෙන යනු ලැබේ.

මීගමුව, උඩප්පුව, පුත්තලම, මඩකලපුව ප්‍රදේශවල ඉස්සන් අභිජනන මධ්‍යස්ථාන රාජ්‍ය හා පෞද්ගලික හවුල් ව්‍යවසායකත්වය (ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

හා කිංග් ඇක්වා සර්විසස් පුද්ගලික සමාගම) යටතේ හා පෞද්ගලික ව්‍යාපාර ලෙස ක්‍රියාත්මක වේ.
විසිතුරු අභිජනන මධ්‍යස්ථාන විශාල සංඛ්‍යාවක් පෞද්ගලික අංශය මගින් විවිධ ප්‍රදේශවල ස්ථාපිත කර ඇත.

6.3 ජලජ ජීව සම්පත් කර්මාන්තයේ උන්නතිය සඳහා වූ සුබසාධන වැඩපිළිවෙල

අවදානම, අඩමානය හා අස්ථිරතාවයෙන් යුත් රැකියාවක යෙදෙන සීමිත කුසලතාවන්ගෙන් හා නිපුණතා මට්ටමින් යුත් ධීවර ප්‍රජාවේ සමාජ සුරක්ෂිතභාවය හා සුභසාධනය පවත්වා ගැනීම ඉතා වැදගත් අවශ්‍යතාවක් බව හඳුනාගෙන ඇත.

මෙම අරමුණු මුදුන්පත් කරගැනීම සඳහා, පහත සඳහන් සුභසාධන හා බලගැන්වීම් වැඩසටහන් ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය සහ එහි අනුබද්ධ ආයතන මගින් හඳුන්වා දී ඇත.

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ක්‍රමය

වයෝවෘද්ධ, බෙලහීන හෝ හදිසි මරණයට පත් වූ ධීවරයන්ට හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් සඳහා මෙම විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක වේ.

ධීවර රක්ෂණ ක්‍රමය සහ ධීවර යාත්‍රා රක්ෂණය

ධීවරයන්ට ධීවර කර්මාන්තයේ දී ඇති අවදානම අවමකර ගැනීම හා ඔවුනට මූල්‍යමය වශයෙන් ස්ථාවර වීමට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා ධීවර රක්ෂණ ක්‍රමය හඳුන්වා දී තිබේ.
සාගරයේ සිදුවන හදිසි අනතුරු සහ ස්වාභාවික විපත් හේතුවෙන් ජීවනෝපායන් අහිමි වන ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය යලි නගා සිටුවීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම ධීවර යාත්‍රා රක්ෂණ ක්‍රමයේ අරමුණයි.

ධීවර ප්‍රජා සංවිධාන

ධීවර කර්මාන්තයේ ඍජුව ම නියුක්ත වන ධීවර කාර්මිකයින් හා ධීවර කර්මාන්තය ආශ්‍රිත වක්‍ර රැකියාවල යෙදෙන පිරිස ද ඇතුළත් ව සමස්ත ධීවර ප්‍රජාවගේ සුභ සාධනය සඳහා මෙම සංවිධාන දායකත්වය සපයන අතර මේවා සෑම දිස්ත්‍රික්කයක ම පිහිටුවා ඇත. ධීවර කාර්මිකයන්ට ලබාදෙන සියලු ම සහනාධාර මෙම සංවිධාන හරහා ලබා දේ.

දියවර දිරිය ලංකා බැංකු ණය යෝජනා ක්‍රමය

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා ලංකා බැංකුව ඒකාබද්ධ ව ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා ධීවර දිරිය සහන පොළී ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වේ.

උතුරු පළාතේ වෙරළ පුනරුත්ථාපන හා සම්පත් කළමනාකරණ වැඩ සටහන්

- ධීවර කර්මාන්තයට අදාළ නවීන තාක්ෂණය, පසු අස්වනු තාක්ෂණය, වෙළඳ පොළ, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීම හා පුහුණු කිරීම
- ධීවර ගම්මාන, තොටුපොළ හා ධීවර ප්‍රජාව සඳහා යටිතල පහසුකම් සැපයීම
- ධීවර වෙළඳ පොළ වැඩි දියුණු කිරීම
- ප්‍රජා මූල මිරිදිය හා ජල ජීව වගා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

කෙටි යෙදුම්

MFAR	Ministry of Fisheries and Aquatic Resources
DFAR	Department of Fisheries and Aquatic Resources
CCD	Coast Conservation Department
NARA	National Aquatic Resources Research and Development Agency
CFC	Ceylon Fisheries Corporation
CFHC	Ceylon Fisheries Harbour Corporation
NAQDA	National Aquaculture Development Authority
NIFNE	National Institute of Fisheries and Nautical Engineering
MEPA	Marine Environment Protection Authority
DF	Department of Forests
DWLC	Department of Wild Life Conservation